**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම - 2025**
**ඉතිහාසය**

විභාග අංකය / නම :...........................................................................................

| 7 ශ්‍රේණිය | | කාලය පැය 02 |
|---|---|---|

## I කොටස

★ **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

★ **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) අතීතයේ මෙරට සිටි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ මින් කුමක්ද?
(i) කෘෂිකර්මාන්තය සිදු කිරීම (ii) කර්මාන්තවල නියැලීම.
(iii) ධීවර කටයුතු කිරීම. (iv) වෙළඳාම් කටයුතු කිරීම.

(2) අතීතයේ දී මැටි කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් හඳුන්වා ඇත්තේ,
(i) තඹකර ලෙසය. (ii) කුම්භකාර ලෙසය.
(iii) පෙහෙකාර ලෙසය. (iv) ස්වර්ණකාර ලෙසය.

(3) සොරබොර වැව ටැම් ලිපිය කරවන ලද රජතුමා වන්නේ,
(i) හතරවන උදය රජුය. (ii) පළමු වන සේන රජුය.
(iii) මහසෙන් රජුය. (iv) දෙවන සේන රජුය.

(4) සකපෝරුව උපයෝගී කරගෙන ඇති කර්මාන්ත මින් කුමක්ද?
(i) යකඩ කර්මාන්තය. (ii) මැණික් කර්මාන්තය.
(iii) පේෂ කර්මාන්තය. (iv) මැටි කර්මාන්තය.

(5) තම පියා වූ දෙවන කස්සප රජු මිය ගිය පසු මානවම්ම කුමරු ආරක්ෂාව පතා පැන ගිය රාජ්‍ය වන්නේ,
(i) චෝල රාජ්‍ය (ii) පාණ්ඩ්‍ය රාජ්‍ය
(iii) පල්ලව රාජ්‍ය (iv) කාලිංග රාජ්‍ය

(6) ක්‍රි:ව: 10 වන සියවසට අයත් නීතිරීති ගැන සඳහන් වන ඉතා වැදගත් ශිලාලිපිය කුමක්ද?
(i) තෝනිගල ශිලා ලිපිය (ii) වේවැල්කැටිය ශිලා ලිපිය
(iii) බදුලු ටැම් ලිපිය (iv) අඹගමුව ශිලා ලිපිය

(7) පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර කුමක්ද?
(i) තන්ජෝරය (ii) මදුරාපුරය
(iii) කාන්චිපුරය (iv) කාලිංගය

(8) දැදිගම කොටවෙහෙර හෙවත් සූතිඝර චෛත්‍යය ඉදිකළ ස්ථානයේ උපන් රජු ලෙස සැළකෙන්නේ,

(i) මහා විජයබාහු රජුය. (ii) මානවම්ම රජුය.

(iii) මහා පරාක්‍රමබාහු රජුය. (iv) දෙවන ගජබාහු රජුය.

(9) දොරමඩලාව නම් ගොපලු ගමේ ළමා කාලය ගත කළ රජතුමා වන්නේ,

(i) පණ්ඩුකාභය රජතුමා (ii) මහසෙන් රජතුමා

(iii) නිශ්ශංකමල්ල රජතුමා (iv) භාතිකාභය රජතුමා

(10) කුරුටු ගීත දැකගත හැකි ස්ථානය වන්නේ කුමක්ද?

(i) මහනුවර දළදා මාලිගාව (ii) දඹුලු රජමහා විහාරය

(iii) සීගිරිය (iv) ගාලු කොටුව

❖ **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණද වරහන තුළ යොදන්න.**

(11) සූපශාස්ත්‍රයේ ප්‍රවීන කාන්තාවන් මධුපාචිකා ලෙස හඳුන්වා ඇත. ( )

(12) ශ්‍රී මාරශ්‍රී වල්ලභ මෙරට ආක්‍රමණය කළ පාණ්ඩ්‍ය රජෙකි. ( )

(13) අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා මහසෙන් රජුය. ( )

(14) උපතේ දී සිදුකළ යුතු සිරිත් විරිත් ජාතකර්ම ලෙස හඳුන්වයි. ( )

(15) අම්බලන්ගොඩ වෙස්මුහුණු නිර්මාණයට ප්‍රසිද්ධය. ( )

❖ **අංක 16 දිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.**

(16) උම්මග්ග ජාතකයේ ............................................... ලෙස හේන හඳුන්වා ඇත.
(සේන්, පිටබිම්, සෙහෙන්)

(17) තෝණිගල ශිලා ලිපියේ ............................................... ලෙස මහා කන්නය හඳුන්වා ඇත.
(අකලහස, පිටදඩහස, මදහස)

(18) ගවයින් රැකබලාගත් පුද්ගලයින් ............................................... නමින් හඳුන්වයි.
(කුඹල්ලු, ලෝකුරුවන්, ගොපල්ලන්)

(19) අතීතයේ ගම් පාලනය කළ නායකයින් ......................................... යනුවෙන් හඳුන්වා ඇත.
(රටිලදු, අදෙකවරු, ගමික)

(20) ස්පෘශ්‍ය උරුමයක් ලෙස සලකනු ලබන්නේ ...............................................
(ජනශ්‍රැති, කෙම් ක්‍රම, ප්‍රතිමා)

(ලකුණු 20x2 =40)

## **II කොටස**

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

★ **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

★ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.**

---

❖ **පහත A, B, C, වලින් දක්වා ඇති රූප ආශ්‍රිතව පිළිතුරු සපයන්න.**

(1)

(i) A රූපයේ දැක්වෙන උපකරණය කුමක්ද?

(ii) මෙම උපකරණය යොදාගන්නා කර්මාන්තය කුමක්ද?

(iii) මෙහි නිෂ්පාදන සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය කුමක්ද?

(ලකුණු 6)



A රූපය

(i) B රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

(ii) මෙම ස්ථානය ඉදිකළ රජු නම් කරන්න.

(iii) මේවා අයත්වන රාජධානි යුගය නම් කරන්න.

(ලකුණු 6)



B රූපය

★ අනුරාධපුර යුගයේ දී මෙරටට බලපෑම් එල්ල කළ රාජ්‍යයන් 3ක් හා ගංගාවක් A, B, C, D ලෙස දක්වා ඇත. ඒවා නම් කරන්න.

(i) A ...............................

(ii) B ...............................

(iii) C ...............................

(iv) D ............................... (ලකුණු 04)




C රූපය

(2) (i) හේන් ගොවිතැනට හානි කරන සතුන් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) හේන්වල වගා කළ A – ධාන්‍ය වර්ග දෙකක්

B – එළවළු බෝග දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) හේන් වගා කළ ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(3) (i) සත්ව පාලනය යටතේ ඇතිකරන ලද සතුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අතීතයේ මෙරට පැවැති කර්මාන්ත 04ක් ලියන්න. (ලකුණු 04)

(iii) වී ගොවිතැන්දී වී වැපිරීමේ සිට අස්වනු නෙළාගන්නා තෙක් ගොයම ආරක්ෂා කර ගැනීමට ගත් සම්ප්‍රදායක ක්‍රම පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(4) (i) වෙළඳාම දියුණු වීමත් සමඟ අතීතයේ දියුණුව පැවති වෙළඳ නගර දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) විදේශ වෙළඳාමට සම්බන්ධ වූ පැරණි වෙළඳ වරායන් 04ක් ලියන්න. (ලකුණු 04)

(iii) විදේශ වෙළඳාම සම්බන්ධ පහත තොරතුරු ලියන්න.

A. ශ්‍රී ලංකාව සමඟ විදෙස් වෙළඳ සබඳතා පැවැත්වූ රටවල් 03 ක්

B. විදෙස් රටවලින් මෙරටට ආනයනය කළ භාණ්ඩ දෙකක් (ලකුණු 05)

(5) (i) අනුරාධපුර යුගයේදී වැඩි කාලයක් මෙරට පාලන බලය ලද රජ පෙළපත් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) රටේ මධ්‍ය පාලනයේ ප්‍රධානියා ලෙස රජුට අයත් වූ කාර්යන් 02ක් ලියන්න. (ලකුණු 04)

(iii) අතීතයේ මෙරට රාජ්‍ය උරුමය ලැබුණු ප්‍රධාන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(6) (i) පළමු වන විජයබාහු රජතුමා පිළිබඳ හැදෑරීමේදී වැදගත් වන මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පළමුවන විජයබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ කරුණු 02ක් දක්වන්න. (ලකුණු 04)

(iii) පළමුවන පරාක්‍රමබාහු රජු පිළිබඳ පහත තොරතුරු සපයන්න.

A. ආර්ථික සේවාවන් 02ක්

B. ශාසනික සේවාවන් 02ක්

C. විදේශ සබඳතා පැවැත් වූ රාජ්‍ය 01ක් (ලකුණු 05)

(7) (i) සංස්කෘතික උරුම බෙදෙන ප්‍රධාන ආකාර 02 නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සංස්කෘතික උරුම 04ක් ලියන්න. (ලකුණු 04)

(iii) අපේ සංස්කෘතික උරුම රැකගැනීමේ වැදගත්කම කරුණු 03ක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 05)